(113)

එන්සිපි/සීඑස්/ඊඩී/11/3-1

2024.12. 10

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ අංක **2022/02(II)**

උතුරු මැද පළාත්
සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා,
දෙපාර්තමේන්තු ප්‍රධානින්.

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව වැටුප් රහිත දේශිය හා විදේශිය නිවාඩු ලබා ගැනිම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2022.08.04 හා 2023.07.20 දිනැති ආයතන චක්‍රලේඛ 2022/02 හා 2022/02 (I) ට වැඩිමනක් වශයෙනි.

02. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින්ට විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි උපරිම වශයෙන් වසර 05ක කාලසීමාවක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන විදේශ රැකියාවකට නිරත වීමට හා ආර්ථික වශයෙන් ඵලදායි කාර්යයක නිරත වීම සඳහා වැටුප් රහිත දේශිය නිවාඩු ලබා ගැනිම සඳහා නිකුත් කර ඇති රා.ප.ච.14/2022 හා ඊට පසුව නිකුත් කර ඇති සංශෝධනයන්හි සඳහන් විධිවිධාන උල්ලංගණය කරමින් සමහර නිලධාරින් නීත්‍යානුකූල නොවන පරිදි සංචාරක වීසා මත හෝ නීත්‍යානුකූල නොවන වෙනත් මාර්ග ඔස්සේ විදේශ ගත වී විවිධ ගැටලුකාරි තත්වයන්ට මුහුණ දී ආපසු දිවයිනට පැමිණ සේවයට වාර්තා නොකර මෙහි කාලයක් ගත කර නැවත විධිමත් අවසරයකින් තොරව විදේශ ගතවී ඇති අවස්ථා පසුගිය කාල සිමාව තුල මා වෙත වාර්තා වී ඇත.

03. එසේම කිසිදු වැඩපිළිවෙලක් හෝ අරමුණක් නොමැතිව ඉහත චක්‍රලේඛන විධිවිධාන මත වැටුප් රහිත දේශිය නිවාඩු ලබාගෙන ඉතා කෙටි කාලසීමාවක් තුල නැවත එකී නිවාඩු අවලංගු කරදෙන ලෙස ඉල්ලීම් සිදු කරන අවස්ථාද පසුගිය කාලසීමාව තුල බොහෝ හෙයින් නිරීක්ෂණය වී ඇත.

04. මෙලෙස රජයේ සේවකයින් සඳහා ලබා දී ඇති අවස්ථාවක් අවභාවිතා කරමින් අදාල චක්‍රලේඛ විධිවිධාන උල්ලංගනය කර කටයුතු කිරිම ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වැනි වගන්තියේ නියමයන් උල්ලංගණය කිරිමක් වන බැවින් එවැනි නිලධාරින්ට එරෙහිව විනයානුකූල පියවර ගැනිමට සිදු වනු ඇත.

05 එබැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන අනුව වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගැනිම සඳහා වන ඉල්ලීම් සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි කටයුතු කල යුතු බව කාරුණිකව දැනුම් දෙමි.

I. සංචාරක වීසා මත හෝ වෙනත් නීත්‍යානුකූල නොවන ක්‍රමවේදයන් මත විදේශ ගත වීමට උක්ත චක්‍රලේඛ ප්‍රකාරව විදේශ නිවාඩු ඉල්ලුම්කර තිබේද යන්න පරික්ෂා කර එවැනි ඉල්ලීම් අනුමැතිය සඳහා ඉදිරිපත් නොකිරීම.

II. නිවාඩු අනුමත කිරීම සඳහා ප්‍රමාණවත් කාල සීමාවක් නොමැතිව ඉදිරිපත් කරනු ලබන විදේශ නිවාඩු ඉල්ලුම්පත් භාර නොගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් නොකිරීම.

III. විදේශ නිවාඩු අනුමත කර ගෙන රැකියා සඳහා විදේශ ගතවී අනුමත නිවාඩු කාල සීමාව අවසන් වීමට පෙර නැවත දිවයිනට පැමිණෙන නිලධාරීන් වහාම සේවයට වාර්තා කල යුතුය. අනුමත නිවාඩු කාල සීමාව අවසන් වීමට පෙර යම් හේතුවක් මත ආපසු දිවයිනට පැමිණ ඇත්නම් එවැනි නිලධාරීන් වහාම ඒ බව (දින 03ක් ඇතුලත) තම ආයතන ප්‍රධානීන්ට දැනුම් දී ඉතිරි කාලය සඳහා වන විදේශ නිවාඩු කාලය අවලංගු කිරීම සඳහා මා වෙත ඉදිරිපත් කලයුතු අතර එලෙස නිවාඩු අවලංගු කිරීම සඳහා වන ඉල්ලීම් නොපමාව මා වෙත ඉදිරිපත් කල යුතුය. ප්‍රමාද වී ඉදිරිපත් කරන එවැනි ඉල්ලීම් සඳහා නිවාඩු අවලංගු කිරීම අදාල ඉල්ලීම් මෙම කාර්යාලයට ලැබුනු දිනය පදනම් කරගෙන සිදු කරන අතර එම හේතුවෙන් සේවයට වාර්තා කරන ලද දින සිට නිවාඩු අවලංගු කරන ලද දිනය දක්වා වැටුප් ගෙවා ඇත්නම් ඒ සම්බන්ධයෙන් ප්‍රමාදයට හේතු වූ නිලධාරීන් වගකිව යුතු බවද අවධාරණය කරමි.

IV. ඉහත චක්‍රලේඛ විධිවිධාන අනුව දේශීය වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති යම් නිලධාරියකු අනුමත නිවාඩු කාලසීමාව අවසන් වීමට ප්‍රථම පිළිගත හැකි හේතුවක් මත නැවත සේවයට වාර්තා කිරීමට ඉල්ලා ඇති විටෙක අදාල ඉල්ලීම ඔබගේ නිර්දේශය සහිතව නොපමාව මා වෙත යොමු කර නිවාඩු අවලංගු කරගත යුතුය.

V. මෙම උපදෙස් තරයේ පිළි පැදිමට සියලුම ලේකම්වරු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කල යුතු අතර ඉහත උපදෙස් වලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන විදේශ නිවාඩු ඉල්ලුම් පත්‍ර හා විදේශ නිවාඩු අවලංගු කිරීම සඳහා වන ඉල්ලීම් කිසිදු හේතුවක් නිසා අනුමැතිය සඳහා මෙම කාර්යාලයට ඉදිරිපත් නොකල යුතු බවද තවදුරටත් අවධාරණය කරමි.

ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත